# එළාර රජු යක්ෂ ගෝත්‍රික ද?

මෙරට ඉතිහාසය හැදෑරීම සඳහා අපට අළුත් මගක් අවශ්‍ය වෙයි. සාම්ප්‍රදායික මතය පිළිබිඹු කරන වංසකතාවල හා ජනප්‍රවාදයෙහි යම් යම් අඩුපාඩුකම් ඇත. එහෙත් ඒ අඩුපාඩුකම්වලට හේතුව වී ඇත්තේ ඊනියා භාරතීය (දඹදිව) ගැති බවක් නොව (සිංහල) ථෙරවාද බුදුදහම සහ සසුන රැකගැනීමේ පරම පවිත්‍ර චේතනාව ය. වංසකතා ලියැවී අවුරුදු එක්දහස් පන්සියයකට පසුව අද ද බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ යටත්විජිතවාදය හමුවේ සිංහල බෞද්ධ සංස්කෘතියේ පැවැත්ම තර්ජනයකට මුහුණ පා සිටින නමුත් අවුරුදු දෙදහසකට ඉහත සිදු වූ කරුණු නැවත සාකච්ඡාකිරීමේ ගැටළුවක් නොමැත.

විශේෂයෙන් ම දෙමළ ජාතිවාදීන් හා ඇමරිකන් විශ්වවිද්‍යාලයීය ව්‍යාපෘතියක කොටසක් ලෙස මෙරට ඉතිහාසය ඊනියා හෙළ සංස්කෘතියකට පැවරීමට කටයුතු කරන ව්‍යාජ සිංහල ජාතිකවාදීන් සිංහල බෞද්ධයන්ගේ උරුමය නැතිකිරීමට කටයුතු කරන මොහොතක සිංහල ඉතිහාසය නැවත සාකච්ඡා කිරීම වැදගත් වෙයි. එහි දී අප මතක තබාගත යුතු කරුණ නම් වංසකතා ඉතිහාසයේ ඇති අඩුපාඩුකම් කිහිපයක් නිවැරදි කිරීම පමණක් අපේ අරමුණ විය යුතු බව ය. ව්‍යාජ සිංහල ජාතිකවාදීහු බුදුන්වහන්සේ මෙරටට වැඩි සමයෙහි ගැමුණු කුමරු රජ කෙළේ ය ආදී මත ප්‍රකාශ කරති.

බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට මුහුණ දීමට අපි බිය නො වෙමු. බටහිර නූතනත්වයේ දුර්වලකම් ගැන අපට මනා අවබෝධයක් ඇත. එහි පදනම ම බොල් බව අපි දනිමු. අපේ සංස්කෘතියේ හා චින්තනයේ ඇති ශක්තිය පිළිබඳ ව ද අපට එවැනි ම වූ අවබෝධයක් වෙයි. අද ඉන්දියාව බටහිරට එරෙහිව කිසිවක් කරකියාගත නොහැකි තත්වයකට පත් වී ඇත. එහෙත් සිංහලයන්ට එවැනි තත්වයක් උදා වී නැත.

මෙරට ඉතිහාසය හැදෑරීමේ දී අපි කරුණු දෙකක් මත පදනම් වෙමු. පළමුවෙන් ම අප ඉතිහාසය හදාරන්නේ අපේ චින්තනය පදනම් කරගනිමින් අපේ සංස්කෘතියට සාපේක්ෂව ය. දෙවැනුව අප ඉතිහාසය හදාරන්නේ අපේ කලාපය, අඩුවැඩි වශයෙන් ගතහොත් වර්තමාන සාර්ක් කලාපය, ඒකකයක් ලෙස සලකමිනි. ඒ දෙකම අඩුම තරමින් ස්ථානීය සංගත බවකින් සිදු කළ යුතු වෙයි.

මෙරට දෙමළ ඉතිහාසයක් ගැන කියැවෙන්නේ වංසකතාවල පමණ ය. ඒ සඳහා පුරාවිද්‍යාත්මක සාධක නැත. දෙමළ ජාතිවාදීන්ට අවුරුදු දෙදහසකට පමණ පෙර මෙරට දෙමළ වාසස්ථාන තිබූ බවට කිවහැකිව තිබෙන්නේ එළාර රජු දෙමළ යනුවෙන් වංසකතාවෙහි සඳහන් පුවත අනුව ය. මේ කතාව නිවැරදි යැයි අපි නො සිතමු. එළාර යනු දෙමළ රජ කෙනකු බවට පත්කරනු ලැබ ඇත්තේ වංසකතා විසිනි. යාපනය විශ්වවිද්‍යාලයේ ඉතිහාසය පිළිබඳ පළමු මහාචාර්යවරයා වූ කාර්තිගේසු ඉන්ද්‍රපාලන් මහතාට අනුව මෙරට දෙමළ වංසයක රාජ්‍යයක් නොව දෙමළ ස්ථිර වාසස්ථාන පවා දොළොස්වැනි සියවසට පෙර තිබී නැත.

සිංහල සංස්කෘතියෙහි එක්තරා යුගයකින් පසුව ඕනෑම සතුරකු දෙමළ නමින් හඳුන්වනු ලැබ ඇත. සිංහල සංස්කෘතියෙහි බලපෑමට පසු කලෙක හසු වූ කාම්බෝජයේ අද පවා සතුරකුට දෙමළ යනුවෙන් නම් පටබැඳෙන බව කියැවෙයි. සෘජු දෙමළ බලපෑමක් නොතිබූ කාම්බෝජයේ ද තත්වය එබඳු නම් ලංකාවේ තත්වය කෙබඳු වී දැයි සිතාගැනීම අපහසු නැත. මහාවංසයෙන් බොහෝ කලකට පසුව ලියැවුණු රාජාවලියේ පෘතුගීසීන් ගැන සඳහන් වනුයේ දෙමළ ලෙස ය.

එළාර රජු දෙමළ රජකු බවට පත්කරනු ලැබුයේ මහාවංස කර්තෘ මහානාම හිමියන් විසින් යැයි අපි මොහොතකටවත් නො සිතමු. උන්වහන්සේ මහාවංසයෙහි සඳහන් කර ඇත්තේ එවකට තිබූ ජනප්‍රවාදය ය. එසේත් නැත්නම් යම්කිසි කෘතියක තිබූ කරුණකි. ඇතැම් විට ඒ දෙකම විය හැකි ය. කෙසේ වෙතත් වංසකතා ලියූ සමය වන විට සිංහලයන් චෝළ ආක්‍රමණවලට මුහුණ දීම ඇරඹි සමය වෙයි. එබැවින් සිංහලයන් ඉන් පසුව සිටි සතුරන් පමණක් නොව පෙර සිටි සතුරන් ද සොළී, දෙමළ ආදී නම්වලින් හඳුන්වා ඇති බව පෙනී යයි.

© Prof. Nalin De Silva

එළාර රජුගේ සොළී බව හෝ දෙමළ බව හෝ සැලකීමට සිදු වී ඇත්තේ එවැනි පසුබිමක ය. එළාර රජු පිළිබඳ ජනප්‍රවාද සොළී රජ මාළිගාවල තිබූ සම්ප්‍රදායක් නොව පර්සියන් රජ මාළිගාවල තිබූ සම්ප්‍රදායක් පිළිබිඹු කරයි. රජුගේ ඇඳ ළග සීනුවක් ගැටගසාගෙන ඇත්තේ පර්සියන් රජවරුන් මිස සොළී රජවරුන් නො වේ. ඒ හැරත් ගැමුණු සමයෙහි සොළී බලයක් දකුණු දඹදිව (භාරතයේ) නො තිබුණි. එබැවින් එකල සොළී එළාර කෙනකු දකුණු දඹදිවින් පැමිණ අනුරාධපුරයෙහි රජ කෙළේ යැයි පිළිගැනීමට නො හැකි ය. අනෙක් අතට එළාර රජුගේ බෑණා කෙනකුට එළාර රජුගේ ආධාරයට සේනාවක් රැගෙන මෙහි පැමිණීමට මාස තුනක් ගතවී යැයි සඳහන් වෙයි. සොළී දේශයෙහි සිට, එනම් පසු කලෙක සොළී දේශය ලෙස හඳුන්වනු ලැබූ දේශයේ සිට, මෙරටට පැමිණීමට එතරම් කලක් ගත නො වෙයි.

අපට විසඳාගත යුතුව ඇති තවත් ප්‍රශ්නයක් වනුයේ එළාර රජුට සේවය කළ සිංහලයන් කවුරුන් ද යන්න ය. දොන් ජුවන් ධර්මපාලට හා පෘතුගීසීන්ට ද සේවය කළ සිංහලයන් සිටි බව ඇත්ත නමුත් ඔවුන් එසේ කෙළේ වරප්‍රසාද බලාගෙන යැයි සිතිය හැකි ය. එහෙත් එළාර රජුට සේවය කළ සිංහලයන් එසේ කෙළේ ඇයි? ඔවුහු සිංහලයෝ වූවෝ ද? එළාර රජුගෙන් ඔවුන්ට ලැබුණු වරප්‍රසාද කවරේ ද?

මේ අතර මහාවංසයට අනුව ගැමුණු රජු මාගම සිට විජිතපුරයට පැමිණ ඇත්තේ දෙමළ බළකොටු තිස්දෙකක් බිඳ දමමිනි. මේ බළකොටු මහවැළි ගඟ අසබඩ පිහිටීම වැදගත් ය. විජිතපුරය යනු පොළොන්නරුව අසළ මහවැලි ගඟ අසබඩ පිහිටි බළකොටුවක් යැයි විශ්වාස කෙරෙයි. රුහුණේ සිට අනුරාධපුරයට යෑමේ දී හමුවන මර්මස්ථානයක් නම් පොළොන්නරුව අසළ මහවැළි ගඟ අසබඩ පිහිටි පිහිටි ප්‍රදේශය ය. මේ ප්‍රදේශය කඳවුරුපුර යනුවෙන් ද හැඳින්වෙන්නේ රටෙහි ආරක්ෂාව සම්බන්ධයෙන් එහි ඇති වැදගත්කම සැළකිල්ලට ගනිමිනි.

කලක් මිනුම් දෙපාර්තමේන්තුවෙහි අධිපතිව සිටි ඩෙස්මන්ඩ් ප්‍රනාන්දු මහතාට අනුව ටොලමි විසින් සකස්කරන ලද ලංකා සිතියමෙහි මහවැළි ගඟ හඳුන්වා දී ඇත්තේ පර්සියන් ගඟ යන අර්ථය දෙන වදනකිනි. මහවැළි ගඟ හා පර්සියාව අතර යම් සම්බන්ධයක් එකළ පැවති බව ඉන් පෙනී යයි. මේ සම්බන්ධය කුමක් ද? ගැමුණු කුමරුට අනුරාධපුරයට යැමට පෙර මහවැළි ගඟ අසබඩ බළකොටු තිස්දෙකක් බිඳ දැමීමට සිදුවූයේ ඇයි? මේ බළකොටු එළාර රජු විසින් හෝ ඔහුගේ ආධාරකාර සොළීන් යැයි කියන්නන් විසින් හෝ ඉදිකරනු ලැබූ බළකොටු ද?

මහවැළි ගඟ අසබඩ යක්ෂ  ගෝත්‍රිකයන් පදිංචි වී සිටි බව පැහැදිළි ය. මහියංගනය යක්ෂ ගෝත්‍රිකයන්ගේ ප්‍රධාන වාසස්ථානයක් බව බුදුන් වහන්සේ යක්ෂ දමනය සඳහා එහි වැඩම කළ බවට සඳහන් ප්‍රවෘත්තියෙන් ද පැහැදිළි ය. යක්ෂ ගෝත්‍රිකයන් ද ලංකාවට හා දඹදිවට පැමින ඇත්තේ පර්සියාවෙන් බවට මතයක් වන බව ඩෙස්මන්ඩ් ප්‍රනාන්දු මහතා පෙන්වා දෙයි. කතරගම දේවාලය යක්ෂ ගෝත්‍රිකයන්ගේ ද දේවාලයක් වූ බවත් මහසෙන් දෙවියන් යක්ෂ දෙවි කෙනකු බවත් ගැමුණු කුමරු එළාර රජු සමග යුද්ධයට යෑමට පෙර කතරගම දේවාලයට යෑමේ එක් හේතුවක් නම් යක්ෂ ගෝත්‍රිකයන් යම් ප්‍රමාණයක හෝ ආධාරය ලබාගැනීම බවත් පැහැදිළි ය. අඩුම තරමින් ඒ කරුණු අතර සංගත බවක් වෙයි.

මේ සියළු කරුණු පදනම්කර ගනිමින් අපට ගෙතිය හැකි ප්‍රවාදය වනුයේ අතීතයේ යම් දිනක ආර්යයන් යනුවෙන් හඳුන්වනු ලබන්නන් දඹදිවට පැමිණීමට පෙර යක්ෂ ගෝත්‍රිකයන් පර්සියාව අසල පිහිටි ප්‍රදේශයකින් දඹදිවට හා මෙරටට පැමිණ යම් තාක්ෂණයක් හඳුන්වා දී ඇති බවත් පසුව දඹදිවට පැමිණි ආර්යයන් දඹදිව උතුරේදීත් ඊටත් පසුව පැමිණි ද්‍රවිඩයන් දකුණේදීත් යක්ෂ ගෝත්‍රිකයන් පරාජය කර ඇති බවත් එහෙත් යක්ෂ ගෝත්‍රිකයන් බුදුන් වහන්සේ දවස ද උතුරු දඹදිව තැනින් තැන වාසය කළ බවත් ය. යක්ෂයන්ගේ චින්තනය ආර්යයන්ගේ චින්තනයෙන් මෙන් ම දඹදිව ආර්යයන් පැමිණීමට පෙර තිබූ ප්‍රාග් වෛදික චින්තනයෙන් ද වෙනස්වූ බව නිසැක ය. ආර්යයන් ප්‍රාග් වෛදිකයන් සමග මිශ්‍ර වී වෛදික චින්තනයක් හා සංස්කෘතියක් ගොඩ නගා ඇති මුත් යක්ෂයන් එසේ මිශ්‍ර වූ බවට සාධකයක් නැත.

ලංකාවට පැමිණි යක්ෂ ගෝත්‍රිකයන් මහවැළි ගඟ අසබඩ මෙන් ම රිටිගල, මින්නේරිය වැනි පෙදෙස්වල ද පදිංචි වී ඇති බව පැහැදිළි ය. මේ යක්ෂ ගෝත්‍රිකයන් එක්වර නොව විටින් විට පැමිණෙන්නට ඇත. එළාර යනු බොහෝ විට

© Prof. Nalin De Silva

පසු කලෙක ලංකාවට පැමිණි යක්ෂ ගෝත්‍රිකයකු හෝ පර්සියාව අසළ ප්‍රදේශයකින් පැමිණි යක්ෂ ගෝත්‍රිකයන්ට නෑකම් කියූ අයකු වන්නට ඇත.

පඬුඅබා රජු දවස සිංහල ජාතිය ගොඩනැගීම ආරම්භ වුව ද ඇතැම් යක්ෂ ගෝත්‍රිකයන් එයට විරුද්ධ වූ බව කලින් සඳහන් කෙරී ඇත. එළාර රජුගේ පැමිණීමත් සමග යක්ෂ ගෝත්‍රිකයන් නැවතත් බලවත් වූ බව පෙනී යයි. එළාර රජු ද බලවත් රජකු වූ බවත් යුද්ධ දක්ෂයකු වූ බවත් නිසැක ය. සිංහල ජාතියට ඇතුල්වීමට විරුද්ධ ව සිටි යක්ෂ ගෝත්‍රිකයන්ට එළාර රජුගේ පැමිණීම මහත් බලාපොරොත්තු ගෙන දෙන්නට ඇත. මේ යක්ෂ ගෝත්‍රිකයන් එළාර රජුට පක්ෂ වන්නට ඇතැයි සිතිය හැකි ය. එළාර රජුට පක්ෂ වූ සිංහලයන් ඔවුන් වන්නට ඇත. මිත්‍ර සෙනෙවි එවැන්නකු විය හැකි ය. මේ යක්ෂ ගෝත්‍රිකයන් එළාර රජුට පක්ෂපාති වන්නට ඇත්තේ හුදෙක් වරප්‍රසාද බලාපොරොත්තුවෙන් නොව මෞර්ය නමින් හඳුන්වනු ලැබූ රජ පරපුරට හා සිංහල ජාතියට විරුද්ධව ය. මහවැලි ගඟ අසබඩ සිටි යක්ෂ ගෝත්‍රිකයන් ද එළාර රජුට පක්ෂපාති වූ බව පෙනී යයි. එළාර රජු අනුරාධපුරයෙහි අවුරුදු හතළිස් හතරක් රජ කර ඇත්තේ යක්ෂ ගෝත්‍රිකයන්ගෙන් ඔහුට ලැබුණු ආධාරය හේතුකොටගෙන යැයි සිතීම සාධාරණ ය.

එහෙත් මෙයින් කියැවෙන්නේ සියළු යක්ෂ ගෝත්‍රිකයන් එළාර රජුට පක්ෂපාති වූ බව නො වේ. චිත්තරාජ හා කාළදේව මෙන් සිංහල ජාතිය ගොඩනැගීමට කැමති වූ යක්ෂ ගෝත්‍රිකයන් ගැමුණු රජ සමයෙහි ද සිටි බව පැහැදිලි ය. එවැනි යක්ෂ ගෝත්‍රිකයන් කාවන්තිස්ස රජුට ද සහාය දෙන්නට ඇත. කාවන්තිස්ස රජුට යක්ෂ ගෝත්‍රිකයන්ගේ පක්ෂපාතිකම් පිළිබඳ ව හොඳ අවබෝධයක් තිබෙන්නට ඇත. අර්ධ වෛදිකයකු වූ කාවන්තිස්ස රජු සියල්ලට පළමුව යක්ෂ නොවන්නන් සමගි කරවීමටත් සිංහල ජාතිය ගොඩනැගීමට කැමැත්තක් දැක් වූ යක්ෂ ගෝත්‍රිකයන් එකතුකර ගැනීමටත් කටයුතු කර ඇති බව පෙනී යයි. කාවන්තිස්ස රජු හා විහාර මහා දේවිය අතර විවාහය ද ඒ අරමුණු කරගත් රාජ්‍යතාන්ත්‍රික විවාහයක් බව පැහැදිලි ය. ගැමුණු කුමරු සැම අතින් ම මේ විවාහයෙහි දරුවා විය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva